

## පාලකයන් ගේ කකුළු උපදෙස්

ලියා දන්වන වග යි

මහින්ද රාජපක්ෂ මහතා පළමු වතාවට ජනාධිපති පදවියට පත්වන්නේ අති බහුතරයක් ප්‍රගතිශීලීන්ගේ සිත් වල බලාපොරොත්තු රැසක් ඇති කරවමිනි. වඩා ජනතාවාදී නායකයකු ලෙස ඔහු රට වෙනුවෙන් විසල් මෙහෙයක් කරන් ඇතැයි යන බලාපොරොත්තුව සැම කෙනෙකුගේම සිත් තුළ විය. ඔහු බලයට පත් වූ මොහොතේ රටේ තිබූ දැවැන්තම ප්‍රශ්නය වූ යුද්ධය අවසන් කරන්නට ඔහුට හැකි වීම ඔහු ලද ප්‍රථම සහ අවසාන ජයග්‍රහණය යයි අපට සිතෙයි.

යුද්ධය අවසන් වීමත් සමගින් රටේ දැවැන්ත පිබිදීමක් ඇති කරමින් වඩා සුබවාදී ඉලක්කයක් කරා මහින්ද රට මෙහෙයවනු ඇතැයි රට වැසියන් දුටු සිහිනය දැන් බොඳ වී යමින් තිබෙයි. රට ඉදිරියට ගෙනයාමේ නිශ්චිත ඉලක්කයක් නොමැතිව සියල්ල අයාලේ යන තත්වයකට රට පත්ව යමින් තිබෙන බව පසෙක සිට විවෘත මනසින් බලා සිටින්නවුන්ට පෙනී යාම නොවැළැක්විය හැකි ය.

කිසිදු සාධාරණ හේතුවකින් තොරව අති දැවැන්ත ඇමති මණ්ඩලයක් පත් කිරීමෙන් නොනැවතී රටේ ධනයෙන් සුවිශාල පංගුවක් ඒ නාස්තිකාර ඇමති මණ්ඩලය නඩත්තු කරන්නට වැය කිරීම මහින්ද ගේ හෘද ශාක්ෂියට කොයි තරම් එකඟදැයි යන්න ගැටළුවකි.

අනෙත් අතින් ඉතිහාසයේ කිසි දිනෙක නොවූ විරූ ලෙස මහ ජනතාවගේ පුද්ගලික නිදහස සීමා කෙරෙමින් පවතියි. පෙමින් වෙලී සිටින තරුණ තරුණියන් පොලිසි කරා දක්කා ගෙන යාමේ සිට පෝස්ටරයක් අත් පත්‍රිකාවක් බෙදීම පවා තහනම් කරමින් රට මේ ගෙන යමින් සිටින්නේ කුමන දිසාවකටදැයි තේරුම් ගැනීමේ හැකියාව ඇත්තේ මහින්ද ගේ ඇමති මණ්ඩලයේ එහෙයියන්ටම පමණකි.

රටේ ජනතාවට පටි තද කරගන්නට උපදෙස් දෙමින් ජනතාවගේ පුද්ගලික නිදහස පවා සීමා කරමින් මේ නාස්තිකාර පාලනය ගෙනයන කාමසුඛල්ලිකානු ප්‍රතිපත්ති වලට එරෙහිව ජනතාව නැගී සිටින දවසක් එළැඹෙනු ඇතැයි අපට ඈත තියා පෙනෙයි.

නිවැරදි වන්නට සිතන්නේ නම් මහින්ද තවමත් ප්‍රමාද නැත.

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .



# Julian Assange ජුලියන් අසාංජ්
# අපේ කාලයේ වීරයෙක්

"අප හැම ජීවත්වන්නේ එක්වරකි. එබැවින්ම අපට ලැබී ඇති කාලයෙන් යහපත් ප්‍රයෝජනයක් ගැනීමත් අර්ථවත් සහ තෘප්තිකර දෙයක් කිරීමත් අප සතු වගකීමකි. මා යෙදී සිටින්නේ අර්ථවත් සහ තෘප්තිකර යැයි මට හැඟෙන කාර්යයකය. මගේ චිත්ත ස්වභාවය එය යි. දැවැන්ත පරිමාණයේ පද්ධති ගොඩ නැගීමෙන් මම සතුටු වෙමි. එමෙන්ම ගොදුරු බවට පත්විය හැකි ජනයාට උදව් කිරීම ද මට සතුට ගෙන එයි. අවලමුන් කුඩුපට්ටම් කර දැමීම ද සතුට ගෙන දේ." - ජුලියන් අසාංජ්

උපතින් ඕස්ට්‍රේලියානුවකු වූ අසාංජ්ට අද රටක් නැත. ඒ ඉහත කී පරිදි ආත්ම තෘප්තිකර ජීවිතයක් ගත කිරීම වෙනුවෙන් ජීවිතය පරදුවට තබා ඇති නිසා ය. තමන්ට සමහර විට ස්විස්ටර්ලන්තයෙහි දේශපාලන රැකවරණ පතන්නට සිදුවනු ඇතැයි පසුගිය සතියේ අසාංජ් ජිනිවා ජනමාධ්‍යයට කියා සිටියේ ය. ලොව මහබලවතුන් විසින් සැඟවීමට උත්සාහ දරණ මානව හිමිකම් කෙළෙසීම් පිළිබඳ තොරතුරු මහජනයා කරා ගෙනයාම අසාංජ් පිටස්තරයෙක් බවට පත් කළ එකම සාධකය වේ.

ඇමෙරිකා එක්සත් ජනපදය පරාජය වූ යුද්ධ ඇත්තේ එකක් යැයි කියනු ලැබේ. ඒ වියට්නාම් ජනයාට එරෙහිව එය විසින් පවත්වාගෙන ගිය දීර්ඝ යුද්ධය යි. ඒ යුද්ධය ඇමෙරිකාව පැරදුනේ වියට්නාම් සටන් බිමෙහිදී නොව ඊට ප්‍රථමයෙන් ඇමෙරිකානු භූමියේදීම ය. ඊට හේතු වුයේ එකල

*<u>මසකට පෙර විකි ලීක්ස් වෙබ් අඩවිය එක්සත් ජනපද යුදහමුදා ක්ෂේත්‍ර වාර්තා 400,000ක් පළ කරමින් කියා සිටියේ විවිධ මානව හිමිකම් කෙළෙසීම් පිළිබඳ සාක්ෂිමය තොරතුරු එහි අඩංගු වන බවයි.</u>*

ජීවත් වූ ජුලියන් අසාංජ් වැනි සිය හෘද සාක්ෂිය වෙනුවෙන් ජීවිතය පරදුවට තැබූ පුද්ගලයින් නිසා ය. ඉන් එක් අයකු ඩැනියෙල් එල්ස්බර්ග් නම් විය. ඇමෙරිකානු රජය එහි ජනයාට යුද්ධය අවම කරමින් සිටින බවට කියන අතරවාරයේ යුද්ධය තීව්‍ර කරමින් සිටිනවා පමණක් නොව අසල්වැසි කාම්බෝජ සහ ලාඕස් යන රටවලටද බෝම්බ හෙළමින් සිටින බව වාර්තාමය සාක්ෂි සහිතව හෙළිදරව් කළ ජනමාධ්‍යවේදියා ඔහුය. පෙන්ටගන් ලියැවිලි නමින් ප්‍රසිද්ධ වූ එම තොරතුරු ලේඛන 1000ක සටහන් වී තිබිණි. මේ හෙළිදරව්ව නිසා රට පාවා දුන් ද්‍රෝහියෙකු ලෙස නම්කරන ලද එල්සබර්ග්ට ඝාතන සැලසුම් වලින් දිවි ගලවා ගැනීමට සිදුවිය. එසේ නමුත් පසු කලෙක එල්ස්බර්ග් යුද්ධයේ අමිහිරි සත්‍යය හෙළිදරව් කළ නිර්භය මිනිසකු සහ වීරයකු ලෙස සැළකුම් ලැබුවේ ය.

අද ඇමෙරිකාවෙහි දක්ෂිණාංශික මතවාදීන් අසාංජ් සළකන්නේ ද ද්‍රෝහියකු ලෙස ය. එසේ නමුත් ලෝකයෙහි කොතැනක වුවත් යුක්තිය සහ සාධාරණත්වය ඉටුවීම ආරම්භ වන්නේ එවැනි මිනිසුන්ගේ නිර්භය ව්‍යායාමයන් නිසාය. අද විශේෂයෙන්ම පාරිභෝගික සමාජ හරයන් විසින් මිනිසුන් කන බොන සහ අණට කීකරුවන රොබෝවරුන් බවට පත් කර ඇති යුගයක එවැනි ධෛර්යමත් මිනිසුන් එනම් අවුන් සාං සුකී වර්ගයේ පිරිමින් සහ ගැහැනුන් අපේ ලෝකයට අත්‍යවශ්‍යය.

අසාංජ්ට ගෙදරක් කියා තැනක් නැත. එක් වාර්තාකරුවකු පැවසුයේ ඔහුගේ නිවෙස විවිධ ගුවන් තොටුපලවල් බව යි. අද රටක් නැතිව තැනින් තැන යමින් සිය ජනමාධ්‍ය මෙහෙවර ඉටු කරන ජුලියන් අසාංජ් එවැනි මිනිසෙකි. ඉරාකයේ ඇමෙරිකානු යුද්ධයට අදාළව විකි ලීක්ස් මගින් අසාංජ් සිවිල් මරණ 66,081 ක් පිළිබඳ විස්තර හෙළිදරව් කළේ ය.

ජුලියන් අසාංජ් විකි ලීක්ස් නමින් හැඳින්වෙන තොරතුරු වෙබ් අඩවියේ නිර්මාතෘවරයා මෙන්ම එහි ගාමක බලවේගය ද වෙයි. මෙම වෙබ් අඩවිය වෙන්ව ඇත්තේ වෙසෙසින්ම රාජ්‍යයන් විසින් රහසිගතව තබා ගැනීමට උත්සාහ කරන මහජන යහපතක් සහ වැදගත්කමක් සහිත තොරතුරු සොයා ගෙන පළ කිරීම පිණිස ය.

පසුගියදා ඔහු ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවරට පැමිණියේ ඇමෙරිකා එක්සත් ජනපදයට එරෙහිව මානව හිමිකම් චෝදනා කිරීම පිණිස ය. ඔබාමා පාලනය යටතේ ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ අධිකාරිය පිළිගත් එක්සත් ජනපදය මෙළෙස ප්‍රශ්න කෙරුණේ ප්‍රථම වතාවට ය. ඇමෙරිකානු හමුදා විසින් ඉරාකයේ දී සහ ඇෆ්ගනිස්ථානයේ දී සිවිල් වැසියන් ඝාතනය කිරීම සහ සිරකරුවන්ට වධ හිංසා පැමිණවීම අරභයා පරීක්ෂණයක් පැවැත්විය යුතු යැයි අසාංජ් ජිනීවා මානව හිමිකම් කොමිසමට කියා සිටියේ ය. තම වෙබ් අඩවිය විසින් පළ කරන ලද ඇමෙරිකානු ආරක්ෂක ලිපි ගොනු විසින් පෙන්වා දෙන සිවිල් වැසියන් ඝාතනය කිරීම් ගැන පරීක්ෂණයක් පැවැත්වීමට කිසිදු පියවරක් ගෙන නැතැයි ද අසාංජ් මානව හිමිකම් කොමිස-

**සුනන්ද දේශප්‍රිය**

මට කියා සිටියේ ය. ඔහු කියා සිටියේ එලෙස සිය හමුදා විසින් කරන ලද මානව හිමිකම් කෙළෙසීම් ගැන පරීක්ෂා කරනු වෙනුවට එක්සත් ජනපදය සිය වෙබ් අඩවියට තොරතුරු දුන් පුද්ගලයින් පසුපස පන්නමින් සිටින බවයි.

මසකට පෙර විකි ලීක්ස් වෙබ් අඩවිය එක්සත් ජනපද යුදහමුදා ක්ෂේත්‍ර වාර්තා 400,000ක් පළ කරමින් කියා සිටියේ විවිධ මානව හිමිකම් කෙළෙසීම් පිළිබඳ සාක්ෂිමය තොරතුරු එහි අඩංගු වන බවයි. මෙම හෙළිදරව්වට පෙර පසුගිය ගිම්හානයේ දී තවත් එවැනි ලේඛන 75,000ක් පළකරමින් විකි ලීක්ස් කියා සිටියේ සිය ගණනාවක් සිවිල් වැසියන් ඝාතනය කිරීම පිළිබඳ සාක්ෂි ඒ අතර වන බව යි.

15 වන පිටට


**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සේයා රූ / Photography**
ප්‍රසන්න කුරුකුලරත්න Prasanna Kurukularatna

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායි-න් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318



**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**